# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
# மாவட்டசெயலகம் – கொழும்பு
# DISTRICT SECRETARIAT – COLOMBO

ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 எல்விடிகலமாவத்தை,நாராஹென்பிட்ட,கொழும்பு 05 ElvitigalaMw, Narahenpita, Colombo 05

විද්‍යුත් තැපෑල மின்னஞ்சல்E-mail: ds@colombo.dist.gov.lk වෙබ් අඩවිය இணைய தளம்Web site: colombo.dist.gov.lk


මගේඅංකය எனது இல My No } DIST.CMB/ES/09/T-05/2026 ඔබේඅංකය உமது இல Your No }

දිනය திகதி Date } 2026.02. 02

.............................................

.............................................

.............................................

<u>කළමනාකරණ සේවා නිලධාරිසේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමේ පාඨමාලාව -X කණ්ඩායම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයට සංශෝධන ලෙස නිකුත් කර ඇති අංක 2052/26 හා 2018.01.04 දරණ අති විශේෂ ගැසට්පත්‍රයේ අංක 06 කරුණ කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරමි.

02. ඒ අනුව කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I පන්තියේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10ක පාඨමාලාව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් **2026 පෙබරවාරි මස 16,17, 18, 19, 20, 23, 24, 25, 26, 27** යන දිනවල **පෙ.ව. 8.30 සිට ප.ව.4.00 දක්වා මෙම කාර්යාලයේ 9 වන මහල ප්‍රධාන ශ්‍රවණාගාරයේදී** පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. (නිල මැඳුර, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05)

03.ඔබ ආයතනය මඟින් යොමු කර ඇති නාමලේඛනය අනුව **X** කණ්ඩායමට ඇතුලත් වී ඇති නිලධාරීන්ගේ නාමලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන අතර, පුහුණු පාඨමාලාවට අදාල කාල සටහන ඉදිරියේදී යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

04. මෙම පාඨමාලාව සඳහා සහභාගී වන නිලධාරීන්ගේ පැමිණීම **2026.02.12** දිනට ප්‍රථම තහවුරු කළ යුතු අතර ඔවුන්ගේ **නම, ජා.හැ.අංකය සහ දුරකථන අංකය**(WhatsApp) අදාල ලිපියේ සඳහන් කිරීම අනිවාර්යයවේ. එම තොරතුරු **011-2369135** යන අංකයට ෆැක්ස් මඟින් හෝ <u>es9training.ds@gmail.com</u>යන විද්‍යුත් තැපැලට යොමු කළ යුතුය.

05. පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ වැඩිදුර අවධානය යොමු කරන අතර ඒ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන්ද කාරුණිකව දන්වා සිටිමි.

i. පුද්ගලික හෝ වෙනත් හේතූන් මත පාඨමාලාව සඳහා සහභාගී නොවන නිලධාරීන්ට මෙම වර්ෂය තුළ තවත් අවස්ථාවක් ලබා නොදෙනු ඇත.


දුරකථන தொலைபேசி Telephone | කාර්යාලය அலுவலகம் Office } 0112 369150 | දිස්ත්‍රික්ලේකම් மாவட்டசெயலாளர் District Secretary } 0112 369134 | අතිරේක දිස්ත්‍රික්ලේකම් மேலதிகமாவட்டசெயலாளர் Addl. District Secretary } 0112 369136

ෆැක්ස් தொலைநகல் Fax } 0112 369142 | ප්‍රධාන ගණකාධිකාරී தலைமைக் கணக்காளர் Chief Accountant } 0112 369143 | අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) பணிப்பாளர் (திட்டமிடல்) Director(Planning) } 0112 369147 | අධ්‍යක්ෂ(කෘෂිකර්ම) பணிப்பாளர் (விவசாயம்) Director(Agriculture) } 0112 369255

ii. කැඳවනු ලබන දිනට සහභාගී නොවන නිලධාරීන් ඉදිරි වර්ෂයේදී පවත්වනු ලබන වැඩසටහනකට සහභාගි වන්නේ නම් ඒ සඳහා වියදම් වන මුදල අදාල නිලධාරියා විසින් දැරිය යුතු වේ.

iii. පාඨමාලාව සාර්ථකව නිම කිරීම වෙනුවෙන් ලබාදෙන සහතිකපත්‍රය ලබාගැනීම සඳහා **100%ක සහභාගීත්වයක්** නිලධාරියා විසින් ලබාගැනීම අනිවාර්යය වේ.

iv. සියලුම නිලධාරීන් සුදුසු කාර්යාලීය ඇඳුමකින් සැරසී පැමිණිය යුතු අතර නිලධාරීන් විසින් ජාතික හැඳුනුම්පත හෝ කාර්යාලීය හැඳුනුම්පත රැගෙන ආයුතුය.

**v. පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත බැවින් මෙම පුහුණු වැඩසටහන සඳහා දිවා ආහාර සහභාගි වන්නන් විසින් සපයා ගත යුතු වේ.**

vi. තවද මෙම වැඩසටහන සඳහා සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. කැඳවනු ලබන සියලුම නිලධාරීන් සහභාගි කරවීම ඔබ සතු වගකීමක් බව කාරුණිකව දන්වා සිටින අතර නාම ලේඛනයේ නම් සඳහන් නමුත් මේ වන විට ඔබ ආයතනයෙන් ස්ථානමාරු වී ගොස් සිටින නිලධාරීන් ද මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.එස්.කාංචනා ගුණවර්ධන
අතිරේක දිස්ත්‍රික් ලේකම්
දුරකථන -011- 2369136
ෆැක්ස් -011- 2369135
විද්‍යුත් ලිපිනය -discmbadm@gmail.com

අත්/කලේ:- ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය